# වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# පුරප්පාඩු

# පොල් පර්යේෂණ ආයතනය

පොල් පර්යේෂණ ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ II)**

**සුදුසුකම් හා පළපුරුද්ද**

බාහිර : පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සිව් අවුරුදු පළමු පෙළ හෝ දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිත විද්‍යා / කෘෂිකර්ම උපාධිය සමග අදාල ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය (PhD).

සහ

පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර පහළවක (15) කළමනාකාරිත්ව මට්ටමේ පර්යේෂණ පළපුරුද්ද හා කළමනාකරණ පළපුරුද්ද එයින් වසර අටක් (08) ආචාර්ය උපාධිය (PhD) ලබා ගැනීමෙන් පසුව විය යුතු අතර අවම වශයෙන් වසර දෙකක් (02) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

සහ

විවිධ ක්ෂේත්‍රවල පර්යේෂණ කණ්ඩායම් නායකත්වය සහ මෙහෙයුම් හැකියාව පෙන්නුම් කළ යුතුය. මානව සහ සෙසු සම්පත් කාර්යක්ෂම කළමනාකරණය පිළිබද පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

අභ්‍යන්තර : ඉහත බාහිර අයදුම්කරුවන්ට අදාළ සුදුසුකම් තිබීම.

හෝ

පොල් පර්යේෂණ ආයතනයේ මධ්‍යම කළමනාකරණ (MM 1-2) සේවා ගණයේ I ශ්‍රේණියේ හෝ අධ්‍යයන/ පර්යේෂණ සේවා මට්ටමේ (AR 2) අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවයක් සපුරා තිබීම.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර 50ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත
- **වැටුප් කාණ්ඩය** : HM 1-3
- **වැටුප් පරිමාණය** : රු. Rs. 86,865/-15x2,270/-120,915/- ආරම්භක වැටුප් තලය : රු. 86,865/- (2/2016 චක්‍රලේඛය ප්‍රකාරව)

**අනෙකුත් ප්‍රතිලාභ :**

01. මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.

i. ජීවන වියදම් දීමනාව - රු.7800/-
ii. ප්‍රවාහන දීමනා රු. 50,000/- හෝ වෙන් කරන ලද නිල වාහනයක්
iii. ඉන්ධන දීමනාව (පෙට්‍රල් / ඩීසල් ලීටර් 115 මාසිකව).
iv. වෘත්තීය දීමනාව
v. සන්නිවේදන දීමනාව
vi. තේ දීමනාව

**02. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී තනතුර (පාංශු හා ශාක පෝෂණ අංශය)**

**සුදුසුකම් :**

බාහිර : පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත් සිව් අවුරුදු (04) විශේෂ පළමු පෙළ හෝ දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිත විද්‍යා හෝ කෘෂිකර්මය උපාධිය

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත් සිව් අවුරුදු (04). විශේෂ දෙවන පෙළ පහළ සාමාර්ථයක් සහිත විද්‍යා හෝ කෘෂිකර්මය උපාධිය සමග අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ එක් අවුරුදු පශ්චාත් උපාධිය.

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත් විද්‍යා හෝ කෘෂිකර්මය උපාධිය සහ අදාළ ක්ෂේත්‍රයේ ද්‍වි අවුරුදු පර්යේෂණ පශ්චාත් උපාධිය

සහ

අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය (PhD) සමග ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 08 ක පර්යේෂණ පළපුරුද්ද.

සටහන : අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂණ නිබන්ධන නිකුත් කර තිබීම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

අභ්‍යන්තර : ආචාර්ය උපාධිය (PhD) සමග අවම වශයෙන් AR 1 ශ්‍රේණියේ පර්යේෂණ නිලධාරියෙකු වශයෙන් වසර 08 ක සතුටුදායක සේවයක් සපුරා තිබීම.

හෝ

ද්‍වි අවුරුදු පර්යේෂණ පශ්චාත් උපාධිය (M Phil/M.Sc.) සමග AR 1 ශ්‍රේණියේ පර්යේෂණ නිලධාරියෙකු වශයෙන් වසර 10 ක සතුටුදායක සේවයක් සපුරා තිබීම.

සටහන : අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂණ නිබන්ධන නිකුත් කර තිබීම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
- **වැටුප් කාණ්ඩය** : AR 2
- **වැටුප් පරිමාණය** : රු. 76,200/-10x2,000/-96,200/-
- **ආරම්භක වැටුප් තලය** : රු. 76,200.00 - (2/2016 (I) චක්‍රලේඛය ප්‍රකාරව)

**අනෙකුත් ප්‍රතිලාභ :**

01. මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.

i. ජීවන වියදම් දීමනාව - රු.7800/-
ii. වෘත්තීය දීමනාව
iii. සන්නිවේදන දීමනාව
iv. තේ දීමනාව

**පොදු කොන්දේසි**

01. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
02. අයදුම්කරු මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් පසුවිය යුතුයි.
03. අයදුම්කරු දිවයින තුළ ඕනෑම ස්ථානයක සේවය කිරීමට කැමති විය යුතුයි.

**පොදු ප්‍රතිලාභ**

01. 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනත යටතේ හා 2016.04.25 දිනැති අංක 2/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව පාරිතෝෂික ගෙවනු ලැබේ.
02. දායකත්ව වෛද්‍යාධාර යෝජනා ක්‍රමයට හිමිකම් ඇත.
03. අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල (අපේක්ෂකයන් විසින් වැටුපෙන් 10% ක් හා මණ්ඩලය විසින් 15% ක් අර්ථසාධක අරමුදල සඳහා සහ 3% ක් සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහාද දායක වනු ඇත.)
04. පොල් පර්යේෂණ ආයතනයේ සේවකයින් හට ලැබෙන අනෙකුත් ප්‍රතිලාභද හිමිවනු ඇත.

**අයදුම්කරුවන් විසින් උප්පැන්න සහ අනෙකුත් අදාළ සියලුම අධ්‍යාපන හා වෙනත් සහතිකපත් වල පිටපත් සහ චරිත සහතික දෙකක් (ඉන් එකක් ග්‍රාම නිලධාරීගෙන් විය යුතුය.), ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක ද සමග අයදුම්කරු විසින් අත්සන් කරන ලද** තම අයදුම්පත 2022.07.12 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, පොල් පර්යේෂණ මණ්ඩලය, ලුණුවිල, 61150 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ප්‍රමාද වී එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවය කරන අය තම අයදුම්පත් ඔවුන්ගේ අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පතේ පිටපතක් සෘජුවම එවිය හැකිය.

ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. අදාළ සහතිකවල පිටපත් නොමැතිව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කාරුණිකව සලකන්න.

**මේ පිළිබඳව බලපෑම් කිරීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත.**

මෙම දැන්වීම පොල් පර්යේෂණ ආයතනයේ වෙබ් පිටුව වන www.cri.gov.lk මගින්ද බලා ගත හැක.

**සභාපති,**
**පොල් පර්යේෂණ මණ්ඩලය,**
**ලුණුවිල.**